**ගම්පහ අධ්‍යාපන කලාපය**

**05 ශ්‍රේණිය - මව්බස**

**කාර්ය පත්‍රිකා අංක 01 - ව්‍යාකරණ**

**01. පහත වගුව සම්පූර්ණ කරන්න.**

| | වර්තමාන කාල | අතීත කාල |
|---|---|---|
| 01 | මම මිහිරි ගීයක් ගයමි. | ............................................ |
| 02 | අපි විනෝද චාරිකාවක් යමු. | |
| 03 | ............................................ | ලේනා ගසින් ගසට පැන්නේ ය. |
| 04 | නංගී ගී ගයමින් නටයි. | ............................................ |
| 05 | ............................................ | ඔහු පොත පාඩම් කළේ ය. |
| 06 | තාත්තා පුවත්පත කියවයි. | ............................................ |
| 07 | මල්ලී බයිසිකලය පදියි. | ............................................ |
| 08 | ............................................ | කුරුල්ලා කූඩුවක් සෑදුවේ ය. |
| 09 | ............................................ | ගුරුතුමිය කතන්දරයක් කීවා ය. |
| 10 | මාමා ගොයම් කපයි. | ............................................ |

(ලකුණු 01 x 10 = 10)

**02. වගුව සම්පූර්ණ කරන්න .**

| | ඒක වචන (වර්තමාන කාල) | බහු වචන (අතීත කාල) |
|---|---|---|
| 01 | ගිරවා වී කරල් කයි. | ............................................ |
| 02 | කුරුල්ලා අහසේ පියාඹයි. | ............................................ |
| 03 | සේවකයා මිදුල අතු ගායි. | ............................................ |
| 04 | ............................................ | වෙළෙන්දෝ බඩු විකුණති. |
| 05 | ............................................ | මොනරු පිල් විදහා නටති. |
| 06 | වලාකුළ අහසේ පාවෙයි. | ............................................ |
| 07 | සමනලයා මල් පැණි බොයි. | ............................................ |
| 08 | ............................................ | සරුංගල් සුළඟේ පාවෙයි. |
| 09 | ගස ඉදිරි බිමට වැටෙයි. | ............................................ |
| 10 | ............................................ | අශ්වයෝ වේගයෙන් දුවති. |

(ලකුණු 01 x 10 = 10)

**03. වගුව සම්පූර්ණ කරන්න .**

| | ඒක වචන (අතීත කාල) | බහු වචන (අතීත කාල) |
|---|---|---|
| 01 | මම චිත්‍රයක් පාට කළෙමි. | ............................................ |
| 02 | නංගී මිහිරි ගීතයක් ගැයුවා ය. | ............................................ |
| 03 | ඔහු බයිසිකලය සෑදුවේ ය. | ............................................ |
| 04 | ............................................ | ගොවියෝ ගොයම් කැපුවෝ ය. |
| 05 | කිරිල්ලී පිහාටු හකුළාගෙන සිටියා ය. | ............................................ |
| 06 | රජු රට පාලනය කළේ ය. | ............................................ |
| 07 | ............................................ | යහළුවෝ ක්‍රීඩා කළෝ ය. |
| 08 | ............................................ | මොනරු පිල් විදහා නැටුවෝ ය. |
| 09 | ............................................ | ක්‍රීඩකයෝ තරගයට දිව්වෝ ය. |
| 10 | ගොවියා උදැල්ල ගෙන කුඹුරට ගියේ ය. | ............................................ |

(ලකුණු 01 x 10 = 10)

**04. පහත සඳහන් වාක්‍යවල හිස්ත ැන් පුරවන්න.**

| | | | |
|---|---|---|---|
| 1. | මම ඊයේ පෙරහැර බැලීමට ……………………… | | (ගියා ය, ගියෙමි) |
| 2. | ලිලී අත්තම්මා පාර මාරුවන්නට උදවු ……………………… | | (කළා ය, කළේ ය) |
| 3. | ඔල්සන් අභයාවකාශ මධ්‍යස්ථානයට ……………………… | | (ආවේ ය, ආවා ය) |
| 4. | ගොවියෝ කුඹුරු වැඩ ……………………… | | (කළහ , කළේ ය) |
| 5. | අපි දිවුල් ගෙඩි කිපයක්ම කා හමාර ……………………… | | (කළෙමු, කළෙමි) |
| 6. | නංගී නිතරම වාගේ කඩයට ……………………… | | (ගියෝ ය, ගියා ය) |
| 7. | මුදලාලි අපට සීනිබෝල ……………………… | | (දුන් හ, දුන්නේ ය) |
| 8. | ලේඛකයෝ පොත් ……………………… | | (ලියූ හ, ලියුවේ ය) |
| 9. | කම්බු තමා පැමිණි දිශාව පෙන්වමින් බිම වාඩි ……………………… | | (ගත්තේ ය, ගත් හ) |
| 10. | ඔහු මිහිරි හඬින් බටනළාව වාදනය ……………………… | | (කළ හ, කළේ ය) |

(ලකුණු 01 x 10 = 10)

**05. පහත වාක්‍ය බහු වචනයට හරවන්න.**

**1.** මම බොහෝ මහන්සි වී වැඩ කළෙමි. ……………………………………………………..

2. ලේනා අඹ ගස උඩ සිටියේ ය. ……………………………………………………..

**3.** නංගී උදේ පාන්දරම දිවුල් ගස යටට ගියා ය. ……………………………………………………..

**4.** ශිෂ්‍යාව උනන්දුවෙන් පාඩම් කළා ය. ……………………………………………………..

**5.** වෛද්‍යවරයා රෝගීන්ට බෙහෙත් දුන්නේ ය. ……………………………………………………..

(ලකුණු 02 x 05 = 10)

06. **ගැළපෙන පදය තෝරා හිස්තැන් පුරවන්න.**

**(ඈ , ඔහු , ඔවුහු , ඌ , ඇය)**

1. අම්මා උදෑසන ම අවදි වෙයි. ………...…එළවළු කොටුවට වතුර දමයි.
2. ඔල්සන් ස්කැන්ඩිනේවියානු ජාතිකයෙකි. ……………..…අභයාවකාශ මධ්‍යස්ථානයේ සේවය කළේ ය.
3. තාත්තා දිනපතාම කඩයට යයි. ……………..……මට සීනි බෝල රැගෙන එයි.
4. අභයාවකාශ මධ්‍යස්ථානයක පක්ෂියෙකු සිටිය හැකිය.…………අමතර වියදමක් නැතිව ආරක්ෂාව සපයයි.
5. අපේ පන්තියේ යහළුවෝ උදෙන්ම පාසලට එති. ……..……බොහෝ උනන්දුවෙන් පිරිසිදු කිරීමේ කටයුතු කරති.
6. නන්දා දක්ෂ ගුරුවරියකි. ……………… බොහෝ කරුණාවන්ත ය.

(ලකුණු 01 x 06 = 06)

**07. බහුවචන වාක්‍ය ලෙස හරවා ලියන්න.**

1. නෙලුම් මල උදෑසන පිපෙයි. ……………………………………………………..
2. ගස සුළඟට ඉදිරී බිමට වැටෙයි. ……………………………………………………..
3. වලාකුළ අහසේ පාවෙයි. ……………………………………………………..
4. තරුව නිවි නිවී දිලෙයි. ……………………………………………………..
5. ගඟ මුහුදට ගලා බසියි. ……………………………………………………..
6. අඹ ගෙඩියක් බිමට වැටෙයි. ……………………………………………………..

(ලකුණු 01 x 06 = 06)

**08. ගැළපෙන උක්ත පදය තෝරා හිසතැන් පුරවන්න.**

1. ……………………………පැටවුන් සමග කෑම සොයා ඇවිදියි. (කිකිළිය , කිකිළියෝ)
2. ……………………………කැලයට ගොස් පලතුරු සොයාගෙන එති. (කිරිල්ලිය , කිරිල්ලියෝ)
3. ……………………………මහන්සි වී ගෙදර වැඩ කළ යුතු ය. (අප , අපි)
4. ……………………………ගෙදර එන අතර ඔහු කුඹුරේ වැඩ කරමින් සිටියේ ය . (මා , මම)
5. ……………………………සිරිපා වන්දනා කිරීමට යති. (සමනල්ලු , සමනලුන්)
6. ……………………………ක්‍රීඩා පිටියේ ක්‍රිකට් ගසති. (ළමයි , ළමයින්)
7. ……………………………රෝගීන් පරීක්ෂා කරති. (වෛද්‍යවරු , වෛද්‍යවරයා)
8. පාසල නිමවීමෙන් පසු …………… තම නිවෙස් වලට යති. (දරුවන් , දරුවෝ)

(ලකුණු 01 x 08 = 08)

ගම්පහ අධ්‍යාපන කලාපය

**09. ගැළපෙන අතීත කාල ක්‍රියාපද යොදන්න.**

1. මම පරිසරය රැක ගැනීමට උනන්දු ……………………..
2. මම තාලයට ගීතයක් ගායනා ……………………..
3. මම ලස්සන චිත්‍රයක් ……………………..
4. මම පසුගිය ඉරිදා දහම් පාසල් ……………………..
5. මම ඉවසීමෙන් කටයුතු ……………………..

(ලකුණු 01 x 05 = 05)

**10. අතීත කාල ක්‍රියාපද යොදන්න.**

1. අපි විනෝද චාරිකාවක් ……………………..
2. අපි සාධාරණ මිල බඩු ……………………..
3. අපි වනය තුළට ගොස් කපු ……………………..
4. අපි රෝද පාර දිගේ වනය තුළට ……………………..
5. අපි හතර පැයක් පමණ යාත්‍රා කොට දූපතේ දකුණු පැත්තට……………………..

(ලකුණු 01 x 05 = 05)

**11. ගැළපෙන වර්තමාන කාල ක්‍රියාපද යොදන්න.**

1. ඔහු තම ඔරුව ගෙන මසුන් ඇල්ලීමට ……………………
2. ඈ ගීතයක් ගායනා ……………………
3. ඔවුහු ඔරුවට නැගී දූපතට ළඟා ……………………
4. අපි ක්ෂණික ආහාර භාවිතයෙන් ……………………
5. ඌ බිම දිගේ ඇදෙමින් තුඹසට ……………………
6. මල් සුවඳ දසත ……………………
7. එළදෙන වසු පැටවාට කිරි ……………………
8. මුවෝ වනයේ ඒ මේ අත ……………………
9. මී මැස්සසෝ මල් වල පැණි ……………………
10. මිනිස්සු කලබල වී නගරය පුරා ……………………

(ලකුණු 01 x 10 = 10)

**12. ලිඛිත බසට හරවා නැවත ලියන්න.**

1. බොහෝ දරුවෝ පාර මාරුවීමට ඇය එනතුරු බලා සිටිනවා.

   …………………………………………………………………………………………..

2. නිල් අහසේ වලාකුළු ඒ මේ අත පාවෙනවා.

   …………………………………………………………………………………………..

3. කෑම සොයා ගිය කුරුල්ලෝ කැදලි කරා පියඹා ගියා.

   …………………………………………………………………………………………..

4. සේපාලිකා මල් සුවඳ දසත පැතිරී යනවා.

   …………………………………………………………………………………………..

5. අපි උදෑසනම පාසල් යාමට සුදානම් වුණා.

   …………………………………………………………………………………………..

6. මම ගෙදර දොර වැඩ කිරීමට අම්මාට උදවු වෙනවා.

   …………………………………………………………………………………………..

7. තාත්තා අවුරුද්දට අපට තෑගි බෝග ගෙනත් දුන්නා.

   …………………………………………………………………………………………..

8. අපි පසුදා ඔරුව බාගෙන එගොඩට යාත්‍රා කළා.

   …………………………………………………………………………………………..

9. නංගී උදේ පාන්දරම දිවුල් අහුලනවා.

   …………………………………………………………………………………………..

10. ඈ වත්ත පහළට ගොස් ඉදුණු කරඹ කැඩුවා.

    …………………………………………………………………………………………..

(ලකුණු 01 x 10 = 10)



ගම්පහ අධ්‍යාපන කලාපය

**05 ශ්‍රේණිය - මව්බස (ව්‍යාකරණ)**

**කාර්ය පත්‍රිකා අංක 01**

# පිළිතුරු පත්‍රය

**01. ප්‍රශ්නය**

1. මම මිහිරි ගීයක් ගැයුවෙමි. 2. අපි විනෝද චාරිකාවක් ගියෙමු.
3. ලේනා ගසින් ගසට පනියි. 4. නංගී ගී ගයමින් නැටුවා ය.
5. ඔහු පාඩම් කරයි. 6. තාත්තා පුවත්පත කියෙව්වේ ය.
7. මල්ලී බයිසිකලය පැද්දේ ය. 8. කුරුල්ලා කූඩුවක් සාදයි.
9. ගුරුතුමිය කතන්දරයක් කියයි. 10. මාමා ගොයම් කැපුවේ ය.

**02. ප්‍රශ්නය**

1. ගිරවු වී කරල් කති. 2. කුරුල්ලෝ අහසේ පියාඹති.
3. සේවකයෝ මිදුල අතුගාති. 4. වෙළෙන්දා බඩු විකුණයි.
5. මොනරා පිල් විදහා නටයි. 6. වලාකුළු අහසේ පාවෙයි.
7. සමනල්ලු මල් පැණි බොති. 8. සරුංගලය සුළඟේ පාවෙයි.
9. ගස් ඉදිරී වැටෙයි. 10. අශ්වයා වේගයෙන් දුවයි.

**03. ප්‍රශ්නය**

1. අපි චිත්‍ර පාට කළෙමු. 2. නංගිලා මිහිරි ගී ගැයුවෝ ය.
3. ඔවුහු බයිසිකල් සෑදුවෝ ය. 4. ගොවියා ගොයම් කැපුවේ ය.
5. කිරිල්ලියෝ පිහාටු හකුළාගෙන සිටියෝ ය./ සිටිය හ. 6. රජවරු රටවල් පාලනය කළෝ ය / කළ හ.
7. යහළුවා ක්‍රීඩා කළේ ය. 8. මොනරා පිල් විදහා නැටුවේ ය.
9. ක්‍රීඩකයා තරඟයට දිව්වේ ය. 10. ගොවියෝ උදලු ගෙන කුඹුරට ගියෝය / ගිය හ.

**04. ප්‍රශ්නය**

1. ගියෙමි. 2. කළා ය. 3. ආවේ ය. 4. කළහ. 5. කළෙමු.
6. ගියා ය. 7. දුන්නේ ය. 8. ලියූ හ. 9. ගත්තේ ය. 10. කළේ ය.

**05. ප්‍රශ්නය**

1. අපි බොහෝ මහන්සි වී වැඩ කළෙමු. 2. ලේන්නු අඹ ගස් උඩ සිටියෝ ය.
3. නංගිලා උදේ පාන්දරර ම දිවුල් ගස් යටට ගියහ/ගියෝ ය. 4. ශිෂ්‍යාවෝ උනන්දුවෙන් පාඩම් කළෝ ය/කළහ.
5. වෛද්‍යවරු රෝගීන් ට බෙහෙත් දුන්නෝ ය / දුන් හ.

**06. ප්‍රශ්නය**

1. ඈ 2. ඔහු 3. ඔහු 4. ඌ 5. ඔවුහු 6. ඇය

**07. ප්‍රශ්නය**

1. නෙලුම් මල් උදෑසන පිපෙයි. 2. ගස් සුළඟට ඉදිරී බිම වැටෙයි. 3. වලාකුළු අහසේ පාවෙයි.
4. තරු නිවි නිවී දිලෙයි. 5 ගඟ මුහුදට ගලා බසියි. 6. අඹ ගෙඩි බිමට වැටෙයි.

**08. ප්‍රශ්නය**

1. කිකිළිය 2. කිරිල්ලියෝ 3. අප 4. මා 5. සමනල්ලු
6. ළමයි 7. වෛද්‍යවරු 8. දරුවෝ

**09. ප්‍රශ්නය**

1. වුණෙමි. 2. කළෙමි 3. ඇන්දෙමි 4. ගියෙමි 5. කළෙමි.

**10. ප්‍රශ්නය**

1. ගියෙමු. 2. විකුණුවෙමු. 3. කැඩුවෙමු. 4. ගියෙමු /රිංගුවෙමු 5. ළඟාවීමු/ගියෙමු/ළඟාවුණෙමු.

**11. ප්‍රශ්නය**

1. යයි. 2. කරයි. 3. වෙයි. 4. වළකිමු. 5. යයි. 6. පැතිරෙයි.
7. දෙයි. 8. දුවති. 9. බොති. 10. දුවති / සැරිසරති.

**12. ප්‍රශ්නය**

1. බලා සිටිති. 2. පාවෙයි 3. ගිය හ / ගියෝ ය 4. යයි 5. වුණෙමු.
6. වෙමි. 7. දුන්නේ ය 8. කළෙමු 9. අහුලයි. 10. කැඩුවා ය.